## පොත් කතා

පහුගිය සතියෙ තිබුන ඩී ඩී කුරුප්පු මහතාගේ පොත් එලිදැක්වීමට ගියා. වයස 89 යි. තවමත් ලියනවා.මේ පාර පොත් හතරක් ආවා. එතුමා ගැන ඕන තරම් කතා අහල තියෙන මම ලියන්නේ නැහැ. ඔහු අපේ සාහිත්‍ය ලෝකේ ඉතිරිවෙලා ඉන්න ශ්‍රේෂ්ඨයන්ගේ අවසන් පුරුකක්. ඒ ඇති ඔහු ගැන.

අපි සාහිත්‍යය ගැන කතා කරමු. සාහිත්‍ය උත්සව යනු එහෙන් මෙහෙන් සිත් කළකිරවන මාතෘකාවක්. ජනතාවට රසය ඥානය පරිකල්පනය නිර්මාණශීලීත්වය ලබාදෙන සාහිත්‍ය උත්සව වෙනුවෙන් ජනතාවගේ ඇති උණන්දුවෙහි ඇති



ප්‍රමාණය ගැන ඇසෙන මැසිවිල්ල මෙතනදිත් නැගුනා. පොතක් මිලදී ගන්න වැයකරන මුදල මින් දෙතුන්ගුණයක් මැක්ඩොනල්ඩ් කන්න වියදම් කිරීම ගැනත් සඳහන් වුනා. ඩොලර් 10ක් 20ක් පොතකය වැය නොකරන මිනිස්සුද ඩොලර් 75-100ක් දීලා හරසුන් ප්‍රසංගයන් බලන්න යෑම අපි කොපමණ නම් කතා කර ඇත්ද? ඒත් අප කිසි කෙනෙක් ඊට විසඳුමක් යෝජනා කරනවද? මිනිස්සු ඒ තැනට පත් නොවීම පිළිබඳ ආඩපාලි නොකියා ඊට ගැලපෙන විසඳුමක් සොයා ගත යුත්තේ සාහිත්‍ය ලැදි අපව නේද? එහෙත්, ඒ කිසිවක් වේදිකාවකදී අදහස් දක්වන කිසිදු සාහිත්‍යධරයෙක් නිකමට හෝ කියනු මා නම් ආස නැහැ.

මේක මහ දිග මාතෘකාවක් වුනත් පොතට පතට ආස චූටි මල්ලිට නම් මෙහෙම හිතෙනවා. මේක ගොඩ ගන්නනම් අපි අපේ ගොඩ වැඩි කරගත යුතුය. මුලින්ම කළ යුත්තේ මේ උත්සවවලට එන ජනතාවගේ සහභාගීත්වයේ ප්‍රමාණය වැඩි කර ගැනී මයි. සාමාන්‍යායන් ඕනෑම සාහිත්‍ය උත්සවයකට පැමිනෙන 50-75 අතර ප්‍රමාණය වැඩි කිරීමට නම මේ උත්සවවලට තනි තනිව පැමිණෙන සියළු දෙනාම අඩුම තරමේ තමන් සමග තවත් මිත්‍රයන් දෙදෙනකු කැඳවා ගෙන ආ යුතුමයි. එය සියළු දෙනාටම ඉතා පහසුවෙන් කළ හැක්කක්. ඊළඟට මේ එන අයට අප යමක් මානසිකව හා භෞතිකව ලබා දිය යුතුයි. ඒ මන්ද අපේ අය පුරුදු වී ඇත්තේ යමක් ලබනවානම් පමණක් කිසියම් කැප කිරීමක් කිරීමත් නිසා. පළමුවෙන් සියළු උත්සව ඉතා කෙටි දේශන ගීත සංවාද අදියෙන් විචිත්‍ර වී විවිධ අද්දැකීම් ලබාදෙන පරිදි වැඩ සටහන් කළ යුතුයි. වැදගත්ම දේ නම් මේ උත්සවවලට සමගාමීව පවත්වන පොත් වෙළඳසල්වල ඉතා අඩු මිලට පොත් ලබා දිය යුතුයි. ඩොලර් 5ට හෝ 10ට දිය හැකියමක් 15-25ට දෙන්න යාම අසාර්ථක මෙන්ම අසාධාරන වෑයමක්. හැම පොතකම මිල උපරිමට ඩොලර් 10ක් කළ යුතුමයි. උත්සවයට පැමිණෙන ඕනෑම තරාතිරමක කෙනෙකුට තමන්ගේ මේ පැමිණීම අපරාධයක් යැයි නොසිතීමට වැඩ සැළසීම සංවිධායකයන්ගේ වගකීමයි. මේක ඉතා සරළ කළහැකි දෙයක් ලෙයසි මට නම් හැඟෙන්නේ.

## මටත් මනාපයක්

ලංකාවෙන් මෙහෙට ඇවිත් මෙහේ දේශපාලනයට සම්බන්ධ වෙනවා කියන්නෙම එක්තරා විදියක ගේමක්. එකක් අපිට ඊට සම්බන්ධ වෙන්න සිද්ධ වෙන්නෙම පහළම තලයේ ඉඳලා. අනෙක ඉතින් අපිට හුරුපුරුදු වෙලා තියෙන සම්තිං දේශපාලනයට මෙහෙ තියෙන ඉඩකඩ ඉතා සීමිත නිසා ඊට ඔරොත්තු දීම ලේසි නෑ. ඉතිං මේ ෆීල්ඩ් එකේ තැනකට එන්න හොඳ කට්ටක් කන්නම වෙනවා.

දැං අපේ ජනගහනයත් වැඩි වෙලා තියෙන නිසා. ඒ ගැන ඇති උනන්දුව මේ පාර නගර සභා ඡන්ද වලට ඉල්ලන අපේක්ෂක සංඛ්‍යාවෙන්ම පේනවා. ඒ කියන්නේ අපේ කට්ටිය මේ කරන්න හදන්නේ අවංකවම ජනතා සේවයට කැපවීමක්. මාරයිනේ. චූටි මල්ලිටනම් තියෙන්නේ මේ ගැන වෙනම විවේචනයක්. ඒත් ඒක මේ වෙලාවේ කරන්නැතුව පොඩි අදහසක් විතරක් එළියට දානවා.



නිකමට වගේ හොයලා බලන්න මේ අපේක්ෂකයෝ ඔබ සොයා ඇවිත් ඔබේ මනාපය ඉල්ලුවත් ඔබ වෙනුවෙන් හෝ ඉල්ලන බල ප්‍රදේශය වෙනුවෙන් කරන හෝ කරන්නට බලාපො- රොත්තු වෙන වැඩක් හො වැඩ පිළිවෙලක් ගැන සඳහනක්වත් කරනවද කියා. වැඩි දෙනෙක් ඉල්ලන්නේ මනාපය පමණයි. කරන්න




බැරි වුනත් ඔවුන් බෙදන පත්‍රිකාවකවත් ඒ ගැන සඳහනක්වත් තිබෙනවද කියා සොයා බලන්න. එසේ නම් අපි අපේ ඡන්ද පාවිච්චි කළ යුත්තේ රටේ කමට හා ජාතියේ කමටද. හිතවත් කමට හෝ යාළු මිත්‍ර නෑදෑකමට ද? එහෙමත් නැත්නම් ඇෆ්ගන් කාරයෝ ඉන්දියන් ලෙබනන් හෝ වෙනත් ජාතීන් ඒ තැනට රිංගාවි කියා අපේ එකෙකුත් දැම්මනම් හරි කියලා මතය සනාත කරන්නද ? මේවා නිවැරදි කරගත යුතු අඩුපාඩු නොවේද? මේ සම්ප්‍රදායෙන් මිදී අපගේ ඡන්දය යමක් කරන්න කළ හැකි අත්දැකීම් ඇති කුමන හෝ ජාතියේ තනතුරකට සුදුසු අයකුට අපගේ ඡන්දය දීම අපේත් රටේත් දියුණුවට වැඩදායී නොවන්නේද? මේක අපට ලංකාවේදී කළ නොහැකි වූ නිසා අඩුම තරමේ මෙහෙදිවත් නිවැරදිව කරන්නට උත්සහ ගනිමු.

අවසාන වශයෙන් කියන්න තියෙන්නේ මෙහේ පහළම තනතුරට පත්වූවන්ටත් වසර 03ක සේවා කාලයෙන් පසු විශ්‍රාම වැටුපක් ලැබෙයි කියා ආරංචිය ඇති බවය. එහි සත්‍යතාව කෙසේ වුවත් එහෙම නම් මේකත් නරක නෑ නේද මිත්‍රවරුණි අමාරුවෙන් හරි ගොඩ දාගත්තොත්?

## මේ එන්නේ හොඳකට නෙවෙයි

පෝලින් හැන්සන් වගේ අය ගැන ලියන්න මං කැමති නැති උනත් දැං ඈ නැවත වතාවක් කරලියට ඇවිත් වගේ. ඇය මෙවර නැගලා තියෙන්නේ අළුත් වේදිකාවක පරන තර්කමයි මාතෘකාව අළුත් ආසියාව වෙනුවට මුස්ලිම් ආ- දේශ කරල ගිය වටයේ ඇගේ මේ වර්ගවාදී අදහස්වලට එරෙහිව සියළු සංක්‍රමනික හීතීන් එකමුතුව දුන් පහර නිසා ඇය ආගිය තැන් නැතිව අතුරුදහන්වී සිටියා. නමුත් මේ වටයේදී ඇය යලිත් ප්‍රබල ලෙස මතුවෙලා ගිය වටයේ මෙන් ඇගේ අදහස්වලට ප්‍රබල විරෝධයක් ඉදිරිපත් වන බවක් පේන්න නැහැ.

කනගාටුවට කරුණ නම් අපේ මිනිස්සුත් මුස්ලිම් විරෝධය නිසා ඇගේ කතාව අනුමත කරන බවක් පේන්න තිබීමයි. මිත්‍රවරුනි අප පැහැදිලිවම තේරුම් ගත යුත්තේ මේ පැමිනෙන්නේ මුස්ලිම් විරෝධයක් පමනක් නොවන වගයි. ඇය මේ වටයේදී ජය ගතහොත් ලැබ්බට තිබූ අත පුහුලටත් නොතියන බවට සාක්ෂි අපට තිබේද ? මුස්ලිම් බෞද්ධ හිංදු ක්‍රිස්තියානි ආදී කුමන අයෙක් මේ රටට පැමිණියත් ඔවුන් පැමිණෙන්නේ නීත්‍යානුකූලව නම් ඒ සියළු දෙනාටම මේ රටේ සමාන අයිතිවාසිකම් තිබිය යුතු බව අපි තේරුම්ගත යුතුය. මුස්ලිම් ජනගහනය වර්ධනය වීම ඔවුන් එකට ඒකරාශී වීම විශාල පල්ලි ආදිය සැදීම ඔවුන්ගේ සංස- ්කෘතික අයිතියකි. එරෙහි විය යුත්තේ ඔවුන් මෙරට නීතියට ඉහලින්



යාමට උත්සහ දරනවානම් පමණි. එබැවින් මුස්ලිම් විරෝධය පසෙකලා සිදුවෙමින් තිබෙන්නේ කුමක්දැයි යන්න ගැන අවදියෙන් සිටිමු.

මෙවර මෙරට ප්‍රධාන මාධ්‍ය පවා ඇය පසු පස ඇති බව ඒවා ක්‍රියා කරන ආකාරයෙන් පේනවා. ඔවුන් ජනමාධ්‍ය හරහා පෝලින් හුරතල් කරන ආකාරය දැකීමත් කණගාටුවට කාරණයක්.

මේ වර්ගවාදී දේශපාලකයන් කිසිදා තුරන් කළ හැකි වර්ගයක් නොවේ. ඔවුන් වරින් වර විවිධ දේශපාලන වේශවලින් මතුවෙයි. එනිසා අපි සිටිය යුත්තේ අවදියෙන්. **මේ ජාතිවාදයට වර්ගවාදයට දුටු තැන වැටෙන්නට පහර දිය යුතුය.**

## ෆුටී

අද ෆුටී ෆයිනල් මැච් එක. මං ෆුටී වලට ඒ තරම් කැමැත්තක් නොදැක්වුවත් මැච් එක ආරම්භයක් අවසානයත් බලනවා. ඇත්තටම



මට වඩාත්ම වැදගත් උනේ ඒ අවස්ථා දෙක. මැච් එකට පෙර ඔවුන්ගේ පිළිවෙල හා මැච් එක අවසන් කරන ආකරයත් ත්‍යාග ප්‍රධානෝත්සවයත් සියල්ල අවසන් වනතුරු ප්‍රේක්ෂක ජනතාව ලක්ෂයක්ම නොසෙල්වී ඉන්නා ආකාරය හරිම චමත්කාර ජනක දර්ශනයක්.

මේ රටේ ක්‍රීඩා ක්ෂේත්‍රයෙන්ම පමණක් කොපමණ දේ අපේ රටට උකහා ගන්න පුළුවන්ද ? යමක් සංවිධානය කරන ආකාරය පැරණි හා දක්ෂ ක්‍රීඩකයින්ට කෙරෙන ගෞරවාචාරය ක්‍රීඩා කිරීමේදී ඇති විනය ක්‍රීඩායේදී හැමෝම නීතයට යටත් වීම, අනෙකාට ගෞරව කිරීම, ජය පරාජය උපේක්ෂා- වෙන් විඳ දරාගනැනීම හා සියල්ල අවසන් වනතුරු තම කණ්ඩායම් සමඟ රැඳී සිටීම ආදී ඕනෑම ක්‍රියාවක තිබිය යුතු ගුනාංග සියල්ලම පාහේ මෙරට රැඳී තිබෙන ආකාරය ගැන කියන්න නම් චූටී මල්ලිට වචන මදි. මට තේරුම් ගන්නබැරි කාරණය නම් කොයි තරම් නම් මෙවැනි උත්සවවලට අපේ රටේ ක්‍රීඩා ඇමතිවරු ලේකම්වරු සභාපතිවරු සංවිධායකයින් සහභාගි වනවාද? ඔවුන් අඩුම තරමේ තරඟයක් අවුලක් නැතිව පවත්වන්නේ කෙසේද කියාවත් ආදර්ශයක්. මේවායින් ලබා නොගන්නේ ඇයිද කියායි. සංවිධායකයින්ට දේශපාලකයින්ගෙන් තොරව යමක් කරගැනීමට කොන්දක් කවදා පහල වෙයිද දේශපාලකයා ද තරග නරඹන්නෙක් බවට පත්වන දිනයක් ගැන සිහිනයෙන් හෝ දකින්නට හැකියා- වක් අපට තිබෙයිද? මේ ගැන ලියනවා තියා හිතන එකත් මාර දුකක් අප්පා, අනේ අපි කවදාක ඉපදෙයිද ඒ රටේ.

## මෙන්න කරනවා නම් වැඩ

කොච්චර අන්තර්ජාලේ සැරිසැරුවත් මේක අහු උනේම නෑනේ. පිළිකා රෝහලක් හදන්න සංගලා



මහේලල දෙවුන්දර තුඩුවේ ඉඳලා පේදුරු තුඩුවට පයින් ගිහල්ලා සල්ලි එකතු කලා කියලා. මාත් ඒ දවස්වල කිය කියා හිටියේ මහේලලාගේ අර මහරගම පිළිකා රෝහල් ප්‍රො ජෙක්ට් එක නැවතුන එක ගැන. දැං බලනකොට කට්ටිය (මහේලලා සංගලා ඇතුළු) පාගමනකුත් ගිහිල්ලා යාපනේ ලක්ෂ 400ක් විතර වියදම් කරලා රෝහලකුත් හදලා පිළිකාවලට ඊයේ දැම්මෙ නෙට් එකේ

මේ මාසේ 6 වෙනිදා ආපහු පේදුරු තුඩුවෙ ඉඳලා දෙවුන්දරතුඩුවට කි.මී.600 ගානක් දවස් 28ක් ඇවිදින්න සෙට් වෙලා. ගාල්ලේ කරාපිටියෙ තවත් පිළිකා රෝහලක් හදන්න.

හද පිරි සුබ පැතුම් පිලිගන්න ලොක්කා. අපිත් ආධාරයක් කරනවා සත්තයි. අරයට මෙයාට උත්තර දෙන්න යන්නෙ නැතුව රියල් ගේමක් දෙන්න දරන උත්සාහය සාර්ථක වෙනවා. අපේ ලංකාවේ ඉන්න පාඨකයන්ට සහෝදරත්වයෙන් ආරාධනා කරනවා. යන්න දවසකට හරි සෙට් වෙන්නෙ මහේලලා දවස් 28 ම ඇවිදිනවලු. යන්න බැරිනම් ඔවුන්ට ධෛර්යය දෙන්න.

ජය වේවා!

මම
චූටි මල්ලි